මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **PE/2024/33** **2024.10.20**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024 නොවැම්බර් 14

### දේශපාලන ගුවන් ප්‍රචාර සඳහා රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන පහසුකම් ලබාදීම

1988 අංක 15 දරණ (සංශෝධිත) පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 126 වැනි වගන්තිය අනුව නාමයෝජනා පත්‍රයක් භාර දී ඇති සෑම පිළිගත් දේශපාලන පක්ෂයකටම හෝ ස්වාධීන කණ්ඩායමකටම දේශපාලන ගුවන් විදුලි ප්‍රචාර පහසුකම් ලබාදිය යුතු වේ.

මෙම ගුවන් කාල වෙන් කිරීම සඳහා කුසපත් ඇදීම 2024.10.22 වන දින පෙ.ව. 10.00 ට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පළමු මහලේ පිහිටි ප්‍රධාන ශ්‍රවණාගාරයේ දී සිදු කිරීමට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමඟ ඒකාබද්ධව මැතිවරණ කොමිෂන් සභාව ක්‍රියා කරනු ලැබේ.

මේ සඳහා 2024 පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් වලංගු නාමයෝජනා පත්‍ර භාර දී ඇති පිළිගත් දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ට (හෝ ලිඛිතව බලය පැවරූ නියෝජිතයින්ට) සහ ස්වාධීන කණ්ඩායම්වල නායකයින්ට (හෝ ලිඛිතව බලය පැවරූ නියෝජිතයින්ට) පමණක් සහභාගී විය හැකි බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්